# කුඹල් කර්මාන්තය හා බැඳුණු දේශීය දැනුම : මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැබඩමුල්ල ග්‍රාම නිළධාරී වසම ඇසුරෙනි.

එම්.සී.එන් ජයවර්ධන[1]

දේශීය දැනුම යනු යම්කිසි සංස්කෘතියකට, භූගෝලීය ප්‍රදේශයකට හෝ සමාජයකට ආවේණික වූ සුවිශේෂී දැනුම් සම්භාරය යි. මෙම දැනුම අදාළ සමාජයේ කෘෂිකර්මය, ආහාර, සෞඛ්‍ය, කර්මාන්ත, පරිසර කළමනාකරණය වැනි නොයෙක් ක්ෂේත්‍රයන්හි දී ජනතාව විසින් සිය දෛනික කටයුතු සඳහා උපයෝගී කරගනු ලබයි. මෙම දැනුම මුඛ පරම්පරාගතව පැවත එන හෙයින් ඉන් විශාල ප්‍රමාණයක් ලේඛන ගත වී නොමැත. ඉපැරණි කර්මාන්තයක් ලෙස පැවත එන්නා වූ කුඹල් කර්මාන්තය සුවිශේෂී වූ දේශීය ඥානයකින් සමන්විත වන්නකි. අධ්‍යයනයේ මූලික අරමුණු වශයෙන් කුඹල් කර්මාන්තයට අදාළ දේශීය දැනුම හඳුනා ගැනීම, එය පරම්පරාවෙන් පරම්පරාවට පවත්වාගෙන එන ආකාරය හඳුනා ගැනීම, දේශීය කුඹල් කර්මාන්තයෙහි වර්තමාන භාවිතය අධ්‍යයනය කිරීම සහ දේශීය දැනුම සංරක්ෂණය පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීම දැක්විය හැකිය.ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැබඩමුල්ල ග්‍රාම නිළධාරී වසම අධ්‍යයනයේ නියැදිය වශයෙන් තෝරා ගෙන තිබේ. ප්‍රදේශයේ කුඹල් ප්‍රජාව සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මඟින් දත්ත රැස් කරන ලදී. දත්ත විශ්ලේෂණය මඟින් එළඹිය හැකි නිගමනය වූයේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කුඹල් කර්මාන්තය වුවත් වර්තමානයේ තරුණ පිරිස් එම කර්මාන්තය වෙතින් දුරස්ව වෙනත් රැකියා සඳහා යොමු වන බව යි. කුඹල් කර්මාන්තයෙහි නිරත වන පිරිස අත් සකපෝරුව, මැටි පිළිස්සුම් ආදී පාරම්පරික ක්‍රමවේද භාවිත කරන අතර ම විදුලි සකපෝරුව ආදී නවීන උපකරණ කරා යොමු වීම දැක ගත හැකි ය. පාරම්පරික දැනුම තවදුරටත් සිය ජීවනෝපාය මාර්ග සකස් කර ගැනීම සඳහා වැබඩමුල්ල ප්‍රදේශයේ ජනතාව භාවිත කරන බව නිගමනය කළ හැකි ය. මුඛ පරම්පරාවෙන් පැවත එන්නා වූ මෙම දැනුම තවමත් ලේඛන ගත කිරීම සඳහා පියවර ගෙන නොමැත. එහෙයින් සුවිශේෂී ඥාන සම්භාරයකින් සමන්විත වන්නා වූ කුඹල් කර්මාන්තය සතු දේශීය ඥානය අනාගත පරම්පරාව උදෙසා සංරක්ෂණය කළ යුතුව ඇත.

මුඛ්‍ය පදඃ- දේශීය දැනුම, කුඹල් කර්මාන්තය

[1] සහකාර කථිකාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය *විශ්වවිද්‍යාලය*, chathurika.navodani@gmail.com